# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


---

මගේ අංකය / எனது இலக்கம் / My NO – 697 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திக / Date – 24/04/2024 පැය 0530

## මාධ්‍ය නිවේදනය

**01. මනුෂ්‍ය ඝාතනයක් - මින්නේරිය පොලිස් වසම.**

2024.04.23 වන දින සවස් කාලයේදී මින්නේරිය පොලිස් වසමේ හේන්යාය ප්‍රදේශයේදී පුද්ගලයෙකුට තියුණු ආයුධයකින් පහරදී හිඟුරක්ගොඩ රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇති බවට මින්නේරිය පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 39 ක් වූ හේන්යාය, මින්නේරිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පුද්ගලික ආරවුලක් හේතුවෙන් ඇති වූ බහින්බස් වීමක් දුරදිග යාමෙන් සැකකරුවන් විසින් මරණකරුට තියුණු ආයුධයකින් පහරදී මෙම ඝාතනය සිදුකර ඇති බවට දැනට සිදුකල විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය හිඟුරක්ගොඩ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අවුරුදු 26 හා 34 වයස්වල පසුවන මින්නේරිය ප්‍රදේශයේ පදිංචි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත. මින්නේරිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. අපරාධ හා වරෙන්තු වලට අවශ්‍ය කර සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - කුලියාපිටිය පොලිස් ස්ථානය.**

කුලියාපිටිය පොලිස් ස්ථානයට වාර්තා වූ නිවසක් බිඳ දේපල සොරකම් කිරීමේ අපරාධයකට අවශ්‍ය කර සිටි සැකකරුවෙකු 2024.04.23 වන දින දහවල් කාලයේ දී කුලියාපිටිය පොලිස් වසමේ පහල දියදොර ප්‍රදේශයේදී කුලියාපිටිය පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 36 ක් වන දළදාගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

**සැකකරු සම්බන්ධයෙන් සිදුකල වැඩිදුර විමර්ශනයේදී මෝදර හා මහව පොලිස් ස්ථාන වලට වාර්තා වූ නිවසක් හා වෙළඳසැලක් බිඳ දේපල සොරකම් කිරීමේ අපරාධයන් දෙකකට හා මහව පොලිස් ස්ථානයේ වරෙන්තු දෙකකට අවශ්‍ය කර සිටි සැකකරුවෙකු බවට අනාවරණය වී ඇත.**

කුලියාපිටිය පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 03. අයිස් මත්ද්‍රව්‍ය හා හෙරොයින් සමඟ සැකකරුවන් පස් දෙනෙකු සහ සැකකාරියක් අත්අඩංගුවට - තලංගම පොලිස් ස්ථානය.

2024.04.23 වන දින සවස් කාලයේදී තලංගම පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් මෙහෙයුමක් සිදුකර **අයිස් ග්‍රෑම් 42 මිලිග්‍රෑම් 300 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවන් සිව් දෙනෙකුද, අයිස් ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 300 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකාරියක්ද, හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 300 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකුද අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 29, 32, 33, 37 හා 53 වයස්වල පසුවන තලාහේන, මුල්ලේරියාව හා අංගොඩ ප්‍රදේශවල පදිංචිකරුවන් වන අතර සැකකාරිය වයස අවුරුදු 36 ක්වූ මාදින්නාගොඩ ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

තලංගම පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 04. නීති විරෝධී මත්පැන් පෙරීමට ගන්නා ගෝඩා සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - අතුරුගිරිය පොලිස් ස්ථානය.

2024.04.23 වන දින උදෑසන කාලයේදී අතුරුගිරිය පොලිස් වසමේ මලවියාකන්ද ප්‍රදේශයේදී අතුරුගිරිය පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරකට අනුව වැටලීමක් සිදුකර නීති විරෝධී මත්පැන් පෙරීමට ගන්නා ගෝඩා ලීටර් 2710 ක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 50 හා 63 යන වයස්වල පසුවන හෝමාගම හා මුල්ලේගම ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

අතුරුගිරිය පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 05. දියේ ගිලී මියයාමක් - නොච්චියාගම පොලිස් වසම.

2024.04.23 වන දින රාත්‍රී කාලයේ නොච්චියාගම පොලිස් වසමේ හල්මිල්ලෑව වැවේ දිය නෑමට ගිය පුද්ගලයෙකු දියේ ගිලී මියගොස් ඇති බවට නොච්චියාගම පොලිසියට ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මෙලෙස මියගොස් ඇත්තේ වයස අවුරුදු 72 ක් වූ හල්මිල්ලෑව ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මෘත ශරීරය නොච්චියාගම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර නොච්චියාගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 06. මාරක රිය අනතුරක් - ගිරිඋල්ල පොලිස් වසම.

2024.04.23 වන දින උදෑසන කාලයේදී ගිරිඋල්ල පොලිස් වසමේ ගිරිඋල්ල පන්නල මාර්ගයේ වැල්ලෑව හන්දිය අසලදී පන්නල දෙස සිට ගිරිඋල්ල දෙසට ධාවනය වූ කාර් රථයක් මාර්ගය හරහා ගමන් කරමින් සිටි පදික කාන්තාවකගේ

ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ පදික කාන්තාව දඹදෙණිය රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 56 ක් වූ නාරම්මල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය දඹදෙණිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරට අදාල කාර් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර ගිරිඋල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**07. මාරක රිය අනතුරක් - බද්දේගම පොලිස් වසම.**

2024.04.23 වන දින උදෑසන කාලයේදී බද්දේගම පොලිස් වසමේ බද්දේගම ගාල්ල මාර්ගයේ බද්දේගම බස්නැවතුම්පල ඉදිරිපිටදී හික්කඩුව දෙස සිට ගාල්ල දෙසට ධාවනය වූ ලොරි රථයක පදික මාරුව මතින් මාර්ගය හරහා ගමන් කරමින් සිටි පදිකයෙකු ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදිකයා කරාපිටිය රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 78 ක් වූ බද්දේගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කරාපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරට අදාල ලොරි රථ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර බද්දේගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**